# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2016 නොවැම්බර් මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 නොවැම්බර් මස 04 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 20.00 යි. තැපැල් ගාස්තුව : රු. 20.00 යි.

**2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2016 නොවැම්බර් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 27/2016

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එහි ඇතැම් වගන්ති බලාත්මක විය යුතු දිනයන් එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇත්නම් මිස, 2016 නොවැම්බර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iii) වන අයිතමයේ, "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28 ක් වේ); සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/28 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iv) වන අයිතමයේ, "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2016 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා සහ, 2016 අප්‍රේල් මස 1 වන දින ආරම්භව 2016 මැයි මස 1 වන දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා සහ 2016 ජූලි මස 12 වන දිනෙන් ආරම්භව 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙර අවසන් වන කාල සීමාව සඳහා; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

2—PL 010225—2,861 (2016/10)

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (iv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(v) 2016 මැයි මස 2 වන දිනයෙන් ආරම්භව 2016 ජූනි මස 30 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා, 2016 ජූලි මස 1 වන දිනෙන් ආරම්භව 2016 ජූලි මස 11 වන දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා සහ, 2016 නොවැම්බර් මස 1 වන දින ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා සහ ඊට පසුව වන යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ).".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ -

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ (ii) අනුඡේදයේ "රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු; සහ" යන වචන වෙනුවට "රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම ඡේදයේ (iii) අනුඡේදයේ "(iii) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(iii) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන, එහෙත් 2016 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් කාල සීමාවක් සඳහා, 2016 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙර අවසන් වන කාල සීමාව සඳහා සහ 2016 ජූලි මස 11 වන දිනෙන්

ආරම්භ වන එහෙත්, 2016 නොවැම්බර් මස 1 වන දින හෝ ඊට පෙරාතුව අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (iii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(iv) 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් තුළට ගැනෙන යම් මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන දොළහ යි දශම පහක් වන,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය එම වගන්තියේ (13) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(14) 2016 ජනවාරි මස 1 වන දින සිට 2016 ජනවාරි මස 13 වන දින දක්වා වන කාලසීමාව සඳහා, යම් ලියාපදිංචි තැනැත්තකු විසින් බදු ඉන්වොයිස්පත්‍රයක් හැර වෙනත් ඉන්වොයිස්පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, සැපයුම් වටිනාකම,-

(i) සියයට එකොළහක අනුප්‍රමාණය නොවන යම් අනුප්‍රමාණයකට බදු එකතු කර ඇති අවස්ථාවක දී -

(අ) යම් භාණ්ඩ සපයනු ලබන අවස්ථාවක, වටිනාකම, සම්පූර්ණ ඉන්වොයිස් වටිනාකම 200/297 න් ගුණ කිරීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණයට සමාන වන බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) යම් සේවාවක් සපයනු ලබන අවස්ථාවක, වටිනාකම, සම්පූර්ණ ඉන්වොයිස් වටිනාකම 100/99 න් ගුණ කිරීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණයට සමාන වන බවට සලකනු ලැබිය යුතු ය.

(ii) කිසිදු බදු මුදලක් එකතු කර නොමැති අවස්ථාවක, වටිනාකම, බදු ඇතුළත් ප්‍රතිෂ්ඨාව සහ සියයට එකොළහක අනුප්‍රමාණයෙන් බදු මුදල බැහැර කිරීමෙන් පසුව ලැබෙන අගයට සමාන වන බවට සලකනු ලැබිය යුතු ය.

(15) සෞඛ්‍යාරක්ෂක සේවා සැපයුම් වටිනාකම, වෛද්‍ය උපදේශක සේවාවන් බැහැර කළ පසු, රෝග විනිශ්චය කිරීමේ පරීක්ෂණ, කාන්දු පෙරන (dialysis) සහ බාහිර රෝගී අංශයෙන් සපයනු ලබන සේවාවන් සම්බන්ධ පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකම වන්නේ ය.

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් කලින් කල, සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයා විමසා, මේ උපවගන්තියේ කාර්ය සඳහා බැහැර කරනු ලැබිය හැකි සේවා සැපයුම් වටිනාකම නියම කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් සාදනු ලබන එවැනි යම් නියෝගයක් කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. එම නියෝග පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු අතර පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව පමණක් බලාත්මක වන්නේ ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා -

"වෛද්‍ය උපදේශනය" යන්නෙන් වෛද්‍ය ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති වෛද්‍යවරයකු විසින් යම් රෝගියෙකුගේ රෝග ඉතිහාසය, රෝගියා පරීක්ෂා කිරීම සහ එම රෝගියාට සත්කාර සහ ප්‍රතිකාර වශයෙන් නිර්දේශයන් කරනු ලබන අවස්ථාවක ක්‍රියා පිළිවෙළ ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ පළමුවන අතුරු විධානයේ "එම ලියාපදිංචි තැනැත්තාගේ බද්දට යටත් සැපයුම් ලෙස සලකනු ලැබිය යුතු අතර," යන වචන වෙනුවට "2016 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවක් සඳහා එම ලියාපදිංචි තැනැත්තාගේ බද්දට යටත් සැපයුම් ලෙස සලකනු ලැබිය යුතු අතර," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ දෙවන අතුරු විධානයේ "එසේ ම තවදුරටත්," යන වචන වෙනුවට "එසේ ම තවදුරටත්, ''2016 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන යම් කාල සීමාවක් සඳහා," යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(i) (iv) වන ඡේදයේ "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2016 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) එහි (iv) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(v) 2016 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරනු ලබන හෝ කරගෙන යනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින් -

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාල සීමාව අවසානයේ දී, එම තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි, එම බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව ඇතුළත

ශ්‍රී ලංකාවේ දී කරන ලද භාණ්ඩ හෝ සේවා හෝ, භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තුනක් වේ නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ කරන ලද බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා, හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන දොළහක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඉදිරියේ දී එළඹෙන බදු අයකළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව තුළ එම තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තුනක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉදිරියේ දී එළඹෙන බදු අය කළ හැකි මාස දොළහක කාලසීමාව සඳහා රුපියල් මිලියන දොළහක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්, එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.’’.

(iii) එම වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන්:-

"එසේම තවදුරටත්, (v) වන ඡේදයේ කාර්ය සඳහා, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය 2016 මැයි

මස 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(i) (ඇ) අනුඡේදයේ "(ඇ) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(ඇ) 2015 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත්, 2016 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දින සිට එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දින හෝ ඊට පෙර අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) එම වගන්තියේ (ඇ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාල සීමාවක් තුළට ගැනෙන යම් මාස තුනක කාල සීමාවක් සඳහා රුපියල් මිලියන දොළහ යි දශම පහක් වන,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(ආ) "සැපයුම් කරන ලද්දේ කවර තැනැත්තෙකුට ද, එම තැනැත්තාගේ නම, ලිපිනය සහ ලියාපදිංචි අංකය;

(ඇ) බදු ඉන්වොයිස්පත්‍රය නිකුත් කරන ලද දිනය සහ එහි අවකාශ නොමැති, සංකේත හතළිහක් නොඉක්මවන අනුක්‍රමික අංකය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "එවැනි සෑම වාර්තාවක් ම නිශ්චිත ආකෘතියෙන් විය යුතු අතර, ඒ ආකෘතියේ දැක්වීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් විය යුතු ය." යන වචන වෙනුවට "එවැනි සෑම වාර්තාවක් ම එම සියලු විස්තර ඇතුළත් නිශ්චිත ආකෘතියෙහි සහ කොමසාරිස්-ජනරාල්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි අදාළ උපලේඛන සමඟ විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) නිශ්චිත ආකෘතියෙහි නොවන සහ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ උපලේඛන ද සමඟ සියලු විස්තර අන්තර්ගත වාර්තාවක් ඉදිරිපත් කර නොමැති සෑම ලියාපදිංචි තැනැත්තකු ම, මේ පනතේ කාර්ය සඳහා සැපයුම් පිළිබඳ වාර්තාවක් සපයා නොමැති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(1ආ) යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දින හෝ එදිනට පෙර ස්වකීය සැපයුම් පිළිබඳ වාර්තාවක් සපයනු ලැබ එහෙත් (1අ) උපවගන්තිය යටතේ ඔහු විසින් වාර්තාවක් සපයා නොමැති බවට සලකනු ලබන අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයා විසින්, එම බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනයේ සිට දින දාහතරක් ඉකුත් වීමට පෙර එම ලියාපදිංචි තැනැත්තා විසින් ඉදිරිපත් කොට ඇති වාර්තාව, සියලු විස්තර එම ආකෘතියෙහි අන්තර්ගත නොවන බැවින් සහ, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ

උපලේඛන ද සමඟ නොවන බැවින් එය නිසි වාර්තාවක් නොවන බව දන්වමින් එම ලියාපදිංචි තැනැත්තා වෙත නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(1ඇ) යම් ලියාපදිංචි තැනැත්තකු වෙත (1ආ) උපවගන්තිය යටතේ නිවේදනයක් ලැබී ඇති අවස්ථාවක, එම ලියාපදිංචි තැනැත්තා විසින් එම නිවේදනය ලැබී දින දාහතරක් ඇතුළත, එම වාර්තාව නිසි වාර්තාවක් බවට පත් කිරීමට අවශ්‍ය වන්නා වූ අදාළ උපලේඛන සහ එම සියලු විස්තර ඇතුළත් එම ආකෘතියෙහි වන නිසි වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, ඉන්පසුව (1අ) උපවගන්තියේ විධිවිධාන එම වාර්තාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(1ඈ) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා වලංගු වාර්තාවක් ලෙස සලකනු ලැබිය හැකි නිසි වාර්තාවක් ලැබීමෙන් පසුව පමණක් සහකාර කොමසාරිස්වරයා විසින් එම වාර්තාව ලැබීම පිළිගනු ලැබිය යුතු ය.'';

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "නියමිත ආකෘති පත්‍රය මත වාර්තාවක් සපයන ලෙස" යන වචන වෙනුවට "අදාළ උපලේඛන සහ එම සියලු විස්තර අන්තර්ගත වන එම ආකෘතියෙහි වාර්තාවක් සපයන ලෙස" යන වචන ආදේශ කිරීමෙන්.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ (අ) ඡේදයේ "එවැනි එක් එක් ඇගඑමක් සඳහා රුපියල් විසිපහක් විය යුතු ය;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා රුපියල් විසිපහක්

විය යුතු අතර, 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා රුපියල් හැත්තෑ පහක් විය යුතු ය;";

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරුවිධානයේ (ආ) ඡේදයේ "පහත අනුප්‍රමාණයන්ට අනුව විය යුතු ය:-" යන වචනවලින් ආරම්භව "(v) වෙනත් යම් රෙදි සඳහා එක් කිලෝග්‍රෑමයකට රුපියල් හතළිහ බැගින්." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා පහත අනුප්‍රමාණයන්ට අනුව විය යුතු ය:-

(i) ලිනන් රෙදි හෝ තිර රෙදි එක් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් හතළිහ යි;

(ii) තුවා සඳහා එක් අයිතමයකට රුපියල් විසි පහ යි;

(iii) රෙදිවලින් නිෂ්පාදිත බෑග් සඳහා එක් අයිතමයකට රුපියල් හතළිහ යි;

(iv) එක් කැබැල්ලක් දිගින් මීටර් දෙකකට වඩා වැඩි නොවන කැබලි රෙදි වශයෙන් වූ අතිරික්ත රෙදි සඳහා එක් කිලෝග්‍රෑමයකට රුපියල් විසි පහ යි;

(v) වෙනත් යම් රෙදි සඳහා එක් කිලෝග්‍රෑමයකට රුපියල් හතළිහ බැගින්; සහ

2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා (i) සිට (v) දක්වා වන ඡේදයන් හි නිශ්චිතව දක්වා ඇති එක් එක් ඒකකයක් සඳහා රුපියල් හැත්තෑ පහක අනුප්‍රමාණයට අනුව විය යුතු ය.".

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ දෙවන අතුරු විධානයේ "යම් සැපයුම්කරුවකුට" යන වචන වෙනුවට "ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) සිට (vii) දක්වා වන අයිතමවල සඳහන් යම් සැපයුම්කරුවකුට" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (10) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ii) වන අයිතමයේ "ලියාපදිංචි සැපයුම්කරුවන් සහ අපනයනකරුවන් වන්නා වූ යම් සැපයුම්කරුවකු විසින් අපනයනකරුවන් වෙත කරන ලද සැපයුම් වන්නා වූ" යන වචන වෙනුවට "එම තැනැත්තන් දෙදෙනාම ලියාපදිංචි වී ඇතිතාක් දුරට යම් සැපයුම්කරුවකු විසින් 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) සිට (vii) දක්වා වන අයිතමවල දක්වා ඇති යම් තැනැත්තකු වෙත කරන ලද සැපයීම් වන්නා වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එම වගන්තියේ (13) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(14) තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ සපයනු ලබන, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ දක්වා ඇති සහ 2016 මැයි මස 2 වන දිනයෙන් ආරම්භ වන යම් කාල සීමාවක් සඳහා මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු, මේ පනත යටතේ බදු සඳහා ලියාපදිංචි වී නොමැති යම් තැනැත්තකුගෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති භාණ්ඩ මිළ දී ගැනීම මත ඉදිරිපත් කරනු ලබන බදු ඉන්වොයිස්පත්‍රයක් නොවන ඉන්වොයිස්පත්‍රයක් මගින් එම භාණ්ඩ මිළ දී ගැනීම තහවුරු කරනු ලබන අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයෙකු විසින් එම මිළ දී ගත් භාණ්ඩ විකුණා ඇති බවට සෑහීමට පත් වේ නම්, එම පළමුව සඳහන් කළ තැනැත්තාට මේ පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බදු බණ්ඩයේ අනුප්‍රමාණය මත එම විකුණුම් සම්බන්ධයෙන් සලකනු ලබන යෙදවුම් බද්දක් සඳහා ඉඩ දෙනු ලැබිය හැකි ය:

එසේ වුව ද, කොමසාරිස්-ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් එම මිළ දී ගැනීම් සඳහා වාර්තාවක් පවත්වාගෙන යා යුතු අතර, එම තැනැත්තාගේ අදාළ වාර්තාව සමග එකී වාර්තාව ද ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ, "2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2015 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව; හෝ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) එම සැපයුම්වල වටිනාකම, අවස්ථාවෝචිත පරිදි, මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක හෝ මාස දොළහක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන දොළහක් ඉක්මවනු ලබන අවස්ථාවක, එම ලියාපදිංචිය 2016 මැයි මස 2 වන දින හෝ එදිනට පසුව වූ යම් කාලසීමාවක් සඳහා සිදු වූයේ නම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ "යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එක් මාසයක් විය යුතු ය; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එක් මාසයක් විය යුතු ය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදයේ "2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස හයක් විය යුතු ය:" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන එහෙත් 2017 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන්වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස හයක් විය යුතු ය:" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) (ආ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) 2017 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා මාස දොළහක් විය යුතු ය;"

(ඈ) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"එසේ වුව ද, මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන මාස දෙළහක කාලසීමාවක් සඳහා ගිණුම් සකස්කර ඇති යම් නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් වන විට, එම මාස දෙළහක කාලසීමාව අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ විය හැකි යඃ

එසේම තවදුරටත්, කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව එම ගිණුම් කාලසීමාව වෙනස් කරනු ලබන අවස්ථාවක දී බදු අයකළ හැකි කාලසීමාව, එම වෙනස්කිරීම සිදු කරනු ලබන අවස්ථාවේ දී සකස් කර ගත හැකි ය.''.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් සහ වෙනත් යම් තැනැත්තකු විසින් එක් එක් බදු අය කළ හැකි කාලසීමාව සම්බන්ධයෙන් -

(අ) එම බදු අය කළ හැකි කාලසීමාව 2017 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන බදු අය කළ හැකි කාලසීමාවක් වේ නම්, බදු අය කළ හැකි කාලසීමාවට පසුව එළඹෙන මාසය අවසන්වීමට පෙරාතුව; සහ

(ආ) එම බදු අය කළ හැකි කාලසීමාව 2017 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන බදු අය කළ හැකි කාලසීමාවක් වේ නම්, එම බදු අය කළ හැකි කාලසීමාවට ඉක්බිතිව ම එළඹෙන මාස හයක කාලයක් ඇතුළත,

නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි වාර්තාවක් සපයනු ලැබිය යුතු ය.

(2අ) (අ) එම ආකෘතියෙහි නොවන වාර්තාවක් සපයනු ලබන හෝ 25ඇ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරුවිධානයේ (ආ) ඡේදයේ දක්වා ඇති පරිදි සෑම මාස හයකදී ම අතුරු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි වාර්තාවේ අන්තර්ගතය හෝ අතුරු ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම පැහැර හරින සෑම ලියාපදිංචි තැනැත්තකු ම, මේ පනතේ කාර්ය සඳහා මූල්‍ය සේවා සැපයුම මත එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්කොට නොමැති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා හෝ යම් මාස හයක කාලසීමාවක් සඳහා මේ වගන්තියේ සහ 25ඇ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති දින හෝ එදිනට පෙර මූල්‍ය සේවා සැපයුම් මත එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තාවක් හෝ අතුරු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනු ලබන සහ, 25ආ වගන්තියේ (2අ) උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ මූල්‍ය සේවා සැපයුම් මත එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්කොට නොමැති ලෙස

සලකනු ලබන අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයා විසින්, එම වාර්තාව හෝ අතුරු ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට නියමිත දිනයේ සිට දින තිහක කාලයක් ඉකුත්වීමට පෙර, එම තැනැත්තා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව හෝ අතුරු ඇස්තමේන්තුව, කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන අදාළ උපලේඛන ද සමග එම සියලු විස්තර අන්තර්ගත ආකෘතියෙහි නොවන බව එම තැනැත්තා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ යම් ලියාපදිංචි තැනැත්තකු වෙත යම් දැන්වීමක් ලැබෙන අවස්ථාවක, එම ලියාපදිංචි තැනැත්තා විසින් එම දැන්වීම ලැබී දින තිහක කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලද වාර්තාව නිසි වාර්තාවක් බවට පත්කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ අදාළ උපලේඛන සහ එම සියලු විස්තර ඇතුළත් එම ආකෘතියෙහි වන නිසි වාර්තාවක් කොමසාරිස්-ජනරාල්වරයා වෙත සපයනු ලැබිය යුතු අතර, ඉන්පසුව එම වාර්තාව සම්බන්ධයෙන් (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.”.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ එම ඡේදයේ "ඊළඟ මාසයේ විසිවන දිනයේ දී ගෙවිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

“ඊළඟ මාසයේ විසිවන දිනයේ දී ගෙවිය යුතු ය:

එසේ වුව ද, 2017 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් මාසික පදනම මත ගෙවිය යුතු බද්ද, අතුරු ඇස්තමේන්තුව මත පදනම්ව

ගණනය කරන ලද බද්දට වඩා අඩු නම් 25(ඇ) වගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති අතුරු ඇස්තමේන්තුව මත ගෙවිය යුතු මුළු බදු වගකීම සහ අතුරු ඇස්තමේන්තුව සැපයීම මත ගෙවිය යුතු සහ ගෙවන ලද මාසික ගෙවීම් අනුව සකස් කිරීම කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන" යන වචන වෙනුවට "ආර්ථිකයේ යහපත සහ ඉඩ දිය හැකි ක්ෂයවීමේ ඒකාකාරී බව පවත්වාගෙන යෑම සැලකිල්ලට ගෙන" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු විධානය ආදේශ කිරීමෙන්:-

"එසේ වුව ද,

(අ) 2017 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, බදු අය කළ හැකි එක් එක් කාලසීමාව සඳහා ලාභ මුදල් ප්‍රමාණය නිසැකව සොයා ගත නොහැකි අවස්ථාවක, එම ලාභ මුදල් ප්‍රමාණය ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව තක්සේරු කළ හැකි ය. තක්සේරු කරන ලද ප්‍රමාණය විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්ෂික පදනමක් මත තථ්‍ය මුදල් ප්‍රමාණය පිළිබිඹු වන පරිදි සකස් කර ගත යුතු අතර, එම සකස් කිරීම, අදාළ ගිණුම් කාලසීමාව වැසීමේ දිනයට පසු මාස හයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) 2017 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භවන යම් බදු අය කළ හැකි කාලසීමාවක්

සඳහා, මාසික ගෙවීම් වෙනුවෙන් මාසික ලාභ නිවැරදිව සොයා ගත නොහැකි අවස්ථාවක, එම ප්‍රමාණය ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව තක්සේරු කළ හැකි අතර, සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ම බදු අය කළ හැකි කාලසීමාවේ එක් එක් මාස හයක කාලසීමාව සම්බන්ධයෙන් නිශ්චිත ආකෘතියෙහි වන ලාභ සම්බන්ධ අතුරු ඇස්තමේන්තුවක් ඒ එක් එක් මාස හයක කාලසීමාවෙන් පසුව එළඹෙන මාසයේ විසි වන දිනට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඈ) සහ (ඉ) ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඈ) 2011 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන එහෙත් 2015 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව සියයට දොළහක් විය යුතු ය; සහ

(ඉ) 2015 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සියයට එකොළහක් විය යුතු ය; සහ

(ඊ) 2016 මැයි මස 2 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සියයට පහළොවක් විය යුතු ය.".

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ,

(අ) එහි (උඋ) ඡේදයේ "උපදින ලාභ හෝ ආදායම" යන වචන වෙනුවට "(ව්‍යාපාරයකින් උපදින ලාභයක් නොවන) උපදින ලාභ හෝ ආදායම" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"මේ උපවගන්තියේ කාර්ය සඳහා, "ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී නොමැති, එහෙත් මූල්‍ය

සමාගමක් විසින් සපයන සේවා වලට සමාන සේවාවක් සපයන තැනැත්තෙකු" යන්නට, ස්වකීය ව්‍යාපාරය හෝ ස්වකීය ව්‍යාපාරයේ කොටසක් විසින් තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන්, තැන්පතු ආකාරයෙන් හෝ ණයකර හෝ බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් මුදල් පිළිගනු ලබන සහ ඒ මත වන පොළී, ලාභ හෝ වට්ටම් ගෙවීම්වලින් සමන්විත වන සහ පොළිය ලබා ගැනීම සඳහා ණය සපයනු ලබන යම් තැනැත්තකු හෝ සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය, එහි (ඌ) ඡේදයේ (ඇ) අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර යම් වත්කමක් මත වන මූල්‍ය කල්බදු ගිවිසුමකට හෝ මෙහෙයුම් කල්බදු ගිවිසුමකට 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ඇතුළත් වී ඇත්නම්,

- එම මූල්‍ය කල්බදු ගිවිසුම යටතේ; හෝ

- එම මෙහෙයුම් කල්බදු ගිවිසුම යටතේ මේ පනත බලාත්මක වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා යම් වාරික සම්බන්ධයෙන්,

වූ කල්බදු පහසුකම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඈ) ඔන්ලයින් මගින් සිදු කරන ලියාපදිංචි කිරීම් සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම, ලියාපදිංචිය සඳහා සාවද්‍ය තොරතුරු උඩුගත කිරීම හෝ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ අවසර දෙන ලද ඉලෙක්ට්‍රොනික ලිපිගොනු පද්ධතිය යටතේ සාවද්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කරන්නා වූ,".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ සැපයුම බදු අයකළ හැකි සැපයුමක් බවට ඉන් අනතුරුව යම් අවස්ථාවක පත් වී සහ," යන වචන වෙනුවට "2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා ඒ සැපයුම බදු අය කළ හැකි සැපයුමක් බවට ඉන් අනතුරුව යම් අවස්ථාවක පත් වී සහ," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ සපයනු ලබන සහ 2016 මැයි මස 2 වන දිනයෙන් ආරම්භව 2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් සඳහා මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු, එසේ ලියාපදිංචි වන දින වන විට ඔහු සතුව මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති යම් භාණ්ඩ තොග නොවිකුණා ඉතිරිව ඇති අවස්ථාවක, එම ලියාපදිංචිය බලාත්මක වන එම බදු අයකළ හැකි කාලසීමාව සඳහා එම භාණ්ඩ තොග සම්බන්ධයෙන් එම තැනැත්තාට 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට සලකනු ලබන මෙහෙයුම් බද්දක් සඳහා ඉඩ දිය හැකි ය:

එසේ වුව ද, එම භාණ්ඩ තොග සම්බන්ධයෙන් 22 වන වගන්තියේ (14) වන උපවගන්තියේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ සමාන වාර්තාවක් පවත්වාගෙන යා යුතු අතර, එම වාර්තාව එම තැනැත්තාගේ අදාළ වාර්තාව ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ කොටසේ (අ) ඡේදයේ,

(අ) (i) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(i) තිරිඟු හෝ තිරිඟු පිටි,'';

(ආ) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (අ) ඡේදයේ (xix) වන අයිතමයේ (ඇ) අනු අයිතමයේ ''(ඇ) 2010 ජුනි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, සැහැල්ලු බර සහිත විදුලි සහ විද්‍යුත් අයිතමයන්;'' යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

''(ඇ) 2010 ජුනි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව, සැහැල්ලු බර සහිත විදුලි සහ විද්‍යුත් අයිතමයන්;'';

(ඇ) (xix) වන අයිතමයේ (ඉ) අනු අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඉ) 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන, එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දිනයෙන් ආරම්භව 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පෙර අවසන් වන කාලසීමාව සඳහා, විදුලි සංදේශ උපකරණ;";

(ඈ) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (අ) ඡේදයේ (xviii) වන අයිතමයේ ''(xviii) පෙට්‍රල්, ගල් අඟුරු හෝ'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"(xviii) පෙට්‍රල් (2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව සපයා ඇත්නම්), ගල් අඟුරු හෝ";

(ඉ) (xx) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xx) 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන, එහෙත් 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භව එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පෙර අවසන් වන කාලසීමාව සඳහා විදුලි සංදේශ කර්මාන්තය සඳහා ම පමණක් පාවිච්චි කිරීම සඳහා ආනයනය කරනු ලබන හෝ මිළ දී ගනු ලබන බවට හඳුනාගත් සහ විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවකු විසින් ආනයනය කරනු ලැබූ හෝ මිළ දී ගන්නා ලද විදුලි සංදේශ කර්මාන්තය සඳහා වූ යම් යන්ත්‍රෝපකරණ හෝ අධිතාක්ෂණික උපකරණ;";

(ඊ) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (අ) ඡේදයේ (xxi) වන අයිතමයේ ''(xxi) (2010 අගෝස්තු මස 18 වන දින හෝ ඉන්පසුව කරන ලද ආනයන ද ඇතුළුව) ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින්ම පමණක් පාවිච්චි කිරීම සඳහා වූ අමතර කොටස් සහ උපාංග;'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"(xxi) 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව, ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩල සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින්ම පමණක් පාවිච්චි කිරීම සඳහා වූ අමතර කොටස් සහ උපාංග;

(උ) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (අ) ඡේදයේ (xxii) වන අයිතමයේ (I) අනු අයිතමයේ ''සුවඳ විලවුන්,'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

''සුවඳ විලවුන් (2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව සපයා ඇත්නම්),'';

(ඌ) (xxv) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxv) - විදුලි සංදේශ කර්මාන්තය සඳහා වූ තඹ කම්බි රැහැන්, ශ්‍රී ලංකාවේ ලබා ගැනීමට නොමැති

අවස්ථාවක, 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව ආනයනය කරන ලද එම තඹ කම්බි රැහැන්; හෝ

- 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භවන එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පෙර අවසන් වන කාලසීමාව සඳහා දේශීය;";

(2) (1) ඒ කොටසේ (ආ) ඡේදයේ,

(අ) එම ඡේදයේ (x) වන අයිතමයේ (උ) අනුඡේදයේ (ඇ) අනු අයිතමය ඉවත්කොට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) මූල්‍ය කල්බදු ගිවිසුමකට හෝ මෙහෙයුම් කල්බදු ගිවිසුමකට 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ඇතුළත් වී ඇත්නම්,

- එම මූල්‍ය කල්බදු ගිවිසුම යටතේ; හෝ

- එම මෙහෙයුම් කල්බදු ගිවිසුම යටතේ 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා යම් වාරික සම්බන්ධයෙන්,

වූ කල්බදු පහසුකම්.".

(ආ) එම ඡේදයේ (xi) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xi) පදිංචිය සඳහා නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදු දීම හෝ කුලියට දීම වන සේවාවන් -

(අ) එම සැපයුම් 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව සිදු වී ඇත්නම්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත්

වී ඇත්තා වූ ද, එම ගිවිසුමට සම්බන්ධ ව්‍යාපෘතිවල මුළු පිරිවැය ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට නොඅඩු සහ ව්‍යාපෘතිය හුදෙක් ම ඉහත කී සැපයුම්, කුලියට දීම හෝ බදු දීමට සම්බන්ධ වන්නා වූ ද, පදිංචිය සඳහා නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදු දීම හෝ කුලියට ලබා දීම හැර එම සේවාවන් යම් ව්‍යවසායක් වන්නා වූ යම් තැනැත්තකු, විසින් සැපයීම,;

(ආ) 2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු යම් තැනැත්තකු විසින් නිවාස ඉඩ පහසුකම් බදු දීම හෝ කුලියට දීමේ සේවාවන් සැපයීම නොවන නිවාස ඉඩ පහසුකම් සැපයීම,'',

(ඇ) (xii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xii) 2016 මැයි මස 2 වන දිනට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භ වන එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සෞඛ්‍යාරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ එම සේවා සපයනු ලබන වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සපයනු ලබන සියලු සෞඛ්‍යාරක්ෂක සේවා;";

(ඈ) (xxvi) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxvi) සීනි හෝ වෙනත් රසකළ ද්‍රව්‍ය අඩංගු කිරිපිටි හැර, එම කිරි ලංකාවේ නිෂ්පාදන කරන තාක් දුරට දේශීයව නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කළ කිරි නිෂ්පාදන සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද සහල් අඩංගු දේශීයව නිෂ්පාදිත සහල් නිෂ්පාදන."

(ඉ) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ආ) ඡේදයේ (xxx) වන අයිතමයේ ''(xxx) දේශීය වශයෙන් නිෂ්පාදිත

ස්වර්ණාභරණ (2009. 01. 01 දින සිට බලාත්මක වන පරිදි)'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"(xxx) 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව, දේශීය වශයෙන් නිෂ්පාදිත ස්වර්ණාභරණ;"

(ඊ) (xxxi) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxxi) 2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භ වන එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්දට යටත් වන්නා වූ විදුලි සංදේශ සේවා සහ, 2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව "විදුලි සංදේශ සේවා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි එම බදු වගකීමෙන් විශේෂයෙන් බැහැර කරන ලද සේවාවන්;";

(උ) (xxxv) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxxv) 2016 මැයි මස 2 වන දිනයට පෙරාතුව සහ 2016 ජූලි මස 11 වන දිනෙන් ආරම්භ වන එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් පිහිටුවන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවාවන්;";

(ඌ) එම ඡේදයේ (XL) අයිතමයේ "අපනයනකරුවන් වෙත හෝ" යන වචන වෙනුවට "2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) සිට (vii) දක්වා වන අයිතමයන්හි දක්වා ඇති යම් තැනැත්තකු වෙත හෝ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(3) ඒ කොටසේ (ඊ) ඡේදයේ (iii) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iii) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ හෝ එසේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසා ඇති පළාත් සභා මගින් පනවා ඇති අදාළ ප්‍රඥප්ති යටතේ ලියාපදිංචි කොට ඇති යම් සමිතියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති ලක් සතොස මගින් 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව සපයනු ලබන භාණ්ඩ හෝ සේවා.";

(4) එම කොටසේ (ඕ) ඡේදයේ-

(අ) (ආ) අනුඡේදයේ "2014 ඔක්තෝබර් මස 25 දිනට පසුව ආනයනය කිරීම" යන වචන වෙනුවට " 2014 ඔක්තෝබර් මස 25 දිනට පසුව එහෙත් 2016 නොවැම්බර් මස 1 දිනයට පෙරාතුව ආනයනය කිරීම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ආ) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඕ) ඡේදයේ (ඇ) අනුඡේදයේ '' බද්දට යටත් වන මත්පැන්,'' යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

''බද්දට යටත් වන මත්පැන් (2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව සපයා ඇත්නම්);''.

**17.** 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, 2016 නොවැම්බර් මස 1 වන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු රැස්කිරීමට බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි අධිකාරී බලය සහිතව ක්‍රියාකර ඇති ලෙස සහ එම බදු එකතු කිරීම වලංගු ලෙස සිදු කර ඇති හා සිදුව ඇති ලෙස සලකනු වලංගුභාවය.

ලැබිය යුතු අතර, එම බදු එකතු කිරීම සම්බන්ධයෙන් උද්ගත විය හැකි සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් එම තැනැත්තා මෙයින් හානිපූරණය කරනු ලැබේ:

එසේ වුව ද, ඉහත කී කාලසීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකතු කරන ලද යම් බදු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයක් හෝ නියෝගයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සඳහා ඉහත කී විධිවිධාන බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.